Annex I

අග්‍රාමාත්‍ය කාර්යාලය
பிரதம அமைச்சரின் அலுவலகம்
PRIME MINISTER'S OFFICE

58, ශ්‍රීමත් අර්නස්ට් ද සිල්වා මාවත, කොළඹ 07.
58, ஸ்ரீமத் ஏர்னஸ்ட் த சில்வா மாவத்தை, கொழும்பு 07.
58, Sir Ernest de Silva Mawatha, Colombo 07.

| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ යොමුව<br>எனது குறியீடு<br>My Ref. | PMO/SEC/01/09 | ඔබේ යොමුව<br>உமது குறியீடு<br>Your Ref. | | දිනය<br>திகதி<br>Date | 2023.01.17 |

*ඉතා වැදගත්*

**සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්,**

**<u>රාජ්‍ය සේවයේ බඳවා ගැනීම් ක්‍රියාවලිය සමාලෝචනය කිරීම සම්බන්ධව අමාත්‍ය මණ්ඩලය විසින් පත්කර ඇති කමිටුව වෙත ඉදිරිපත්වන ඉල්ලීම් සම්බන්ධව</u>**

"රාජ්‍ය සේවයේ බඳවා ගැනීම් ක්‍රියාවලිය සමාලෝචනය කිරීම" මැයෙන් මාගේ සමාංක හා 2022.12.28 දිනැති ලිපියට වැඩිමනත් වශයෙනි. (අදාළ ලිපියේ ඡායාස්ථිත පිටපතක් ඔබ පහසු පරිශීලනය සඳහා ඇමුණුම් කර ඇත.)

උක්ත ලිපිය මගින් අදාළ උපදෙස් ලබා දී තිබියදීත්, කමිටුව වෙත නව බඳවා ගැනීම් සම්බන්ධව හෝ තනතුරුවල පවතින පුරප්පාඩු සම්පූර්ණ කිරීම සම්බන්ධව ඉල්ලීම් ලිපි රේඛීය අමාත්‍යාංශ ලේකම්වරයාගේ පෞද්ගලික අත්සනින් යුතුව සාධාරණීකරණයන් හා නිර්දේශ රහිතව ඉදිරිපත් වන බව තවදුරටත් නිරීක්ෂණය කරමි.

එබැවින්, විධිමත් මානව සම්පත් විශ්ලේෂණයකින් අනතුරුව අත්‍යවශ්‍යයෙන්ම බඳවා ගත යුතු තනතුරු/ නව බඳවා ගැනීම් /පුරප්පාඩු සම්පූර්ණ කිරීම් සම්බන්ධව ඔබ පෞද්ගලිකවම සෑහීමකට පත්වන්නේ නම් පමණක් එම තනතුරු සම්පූර්ණ කිරීම සම්බන්ධව සාධාරණීකරණයන් සහ නිර්දේශ ඇමුණුම් කර ඇති ආකෘති පත්‍රයට අනුකූලව පමණක් සකස් කොට ඉදිරිපත් කරන මෙන් කාරුණිකව දන්වමි.

තවද, ඔබ අමාත්‍යාංශය යටතේ පවතින දෙපාර්තමේන්තු හා ආයතනවල නව තනතුරු ඇති කිරීම හා තනතුරුවල පවතින පුරප්පාඩු සම්පූර්ණ කිරීම සම්බන්ධව අදාළ දෙපාර්තමේන්තු/ ආයතන ප්‍රධානියාගේ ද සාධාරණීකරණයන් හා නිර්දේශ මෙම ආකෘතියට සමාන ආකෘතියකින් ලබා ගැනීම සම්බන්ධයෙන් මෙම කමිටුවේ විරුද්ධත්වයක් නොමැති බවද වැඩිදුරටත් කාරුණිකව දන්වමි.

**අනුර දිසානායක**
අග්‍රාමාත්‍ය ලේකම් සහ
සභාපති, රාජ්‍ය සේවයේ බඳවා ගැනීම් ක්‍රියාවලිය සමාලෝචනය කිරීමේ අමාත්‍ය මණ්ඩල නිලධාරී කමිටුව

දුරකථන අංකය : +94 11- 2575311    ෆැක්ස් අංකය : +94 11- 2575310
විද්‍යුත් ලිපිනය : secpm@pmoffice.gov.lk

පිටපත් :-

1. ජනාධිපති ලේකම්
2. විගණකාධිපති
3. අමාත්‍ය මණ්ඩල ලේකම්
4. ලේකම්, මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය
5. ලේකම්, රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය
6. අධ්‍යක්ෂ ජනරාල්, ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුව
7. අධ්‍යක්ෂ ජනරාල්, රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිව්‍යුහගතකරණ ඒකකය
8. ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්
9. අධ්‍යක්ෂ ජනරාල්, කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව

කාර්යාලය / அலுவலகம் / Gen. Office: 2575317, 2575318
ෆැක්ස් / பெக்ஸ் / Fax: 2574143, 2575454, 2575310
විද්‍යුත් තැපැල / ஈ மெயில் / E - mail: secpm@pmoffice.gov.lk

<u>රාජ්‍ය සේවයේ බඳවා ගැනීම් ක්‍රියාවලිය සමාලෝචනය කිරීම</u>

1. අමාත්‍යාංශය :

2. දෙපාර්තමේන්තුව / ආයතනය :

3. අනුමත කාර්ය මණ්ඩලය :

4. තථ්‍ය කාර්ය මණ්ඩලය :

5. පුරප්පාඩු සංඛ්‍යාව :

(3–5) අදාළව නිවැරදි තොරතුරු ඇතුලත් ලේඛන ඇමුණුම් වශයෙන් ඉදිරිපත් කල යුතුය.

6. අනුමත කාර්ය මණ්ඩලය තුළ තනතුරු පුරප්පාඩු පැවතිය ද අත්‍යවශයෙන්ම බඳවා ගත යුතු පුරප්පාඩු ප්‍රමාණය හා තනතුරු නාමයන්

..........................................................................................................................

..........................................................................................................................

..........................................................................................................................

..........................................................................................................................

..........................................................................................................................

7. විධිමත් මානව සම්පත් විශ්ලේෂණයකින් අනතුරුව හඳුනා ගත් පුරප්පාඩුවල ඇති අවශ්‍යතාවය හා පවතින පුරප්පාඩු සම්පූර්ණ කිරීම සම්බන්ධව එක් එක් තනතුරෙහි රැකියා විස්තරයට අදාළව රැකියාවේ ස්වභාවය සහ වගකීම

..........................................................................................................................

..........................................................................................................................

..........................................................................................................................

..........................................................................................................................

..........................................................................................................................

..........................................................................................................................

8. ආයතනයේ කටයුතු ප්‍රශස්තව පවත්වා ගෙන යාමට බාධාවක් වන අයුරින් එම තනතුරුවල ඇති වී ඇති දැඩි අවශ්‍යතාවය සංක්ෂිප්තව

..........................................................................................................................

..........................................................................................................................

..........................................................................................................................

..........................................................................................................................

..........................................................................................................................

..........................................................................................................................

9. මෙම තනතුරු ඇති කිරීම / පුරප්පාඩු සම්පූර්ණ කිරීම සම්බන්ධයෙන් දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශය

..................................................................................................................................

..................................................................................................................................

..............................................                                                                 ................................

අත්සන හා නිලමුද්‍රාව                                                                                    දිනය

10. මෙම තනතුරු ඇති කිරීම / පුරප්පාඩු සම්පූර්ණ කිරීම සම්බන්ධයෙන් **අමාත්‍යාංශ ලේකම්වරයාගේ සාධාරණීකරණය සහ නිර්දේශය**

..................................................................................................................................

..................................................................................................................................

..................................................................................................................................

..............................................                                                                 ................................

අත්සන හා නිලමුද්‍රාව                                                                                    දිනය

# අග්‍රාමාත්‍ය කාර්යාලය
## பிரதம அமைச்சரின் அலுவலகம்
## PRIME MINISTER'S OFFICE

58, ශ්‍රීමත් අර්නස්ට් ද සිල්වා මාවත, කොළඹ 07.
58, ஸ்ரீமத் ஏர்னஸ்ட் த சில்வா மாவத்தை, கொழும்பு 07.
58, Sir Ernest de Silva Mawatha, Colombo 07.


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ යොමුව<br>எனது குறிப்பு<br>My Ref. | PMO/SEC/01/09 | ඔබේ යොමුව<br>உமது குறிப்பு<br>Your Ref. | | දිනය<br>திகதி<br>Date | 2022.12.28 |

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්,
පළාත් ප්‍රධාන ලේකම්වරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානීන්,

<u>රාජ්‍ය සේවයේ බඳවාගැනීම් ක්‍රියාවලිය සමාලෝචනය කිරීම</u>

උක්ත කරුණ සම්බන්ධයෙන් මගේ සමාංක හා 2022.12.05 දිනැති ලිපියට වැඩිමනත් වශයෙනි.

රජය විසින් කලින් කල ගනු ලැබූ ප්‍රතිපත්තිමය තීරණ මත මානව සම්පත් අවශ්‍යතාව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව හරහා නිසි ලෙස හඳුනා ගැනීමකින් තොරව හා සේවා ව්‍යවස්ථා ප්‍රතිපාදනවලට පරිබාහිරව බඳවා ගැනීම් රාශියක් සිදුකර ඇති බැවින් මේ වන විට අවශ්‍යතාවයට සාපේක්ෂව මානව සම්පත අතිරික්ත වී ඇති බැවින් රාජ්‍ය සේවයට සිදු කෙරෙන නව බඳවාගැනීම් තාවකාලිකව අත්හිටුවා ඇත.

එහෙත්, විවිධ බඳවාගැනීම් සම්බන්ධව අධිකරණ ක්‍රියාමාර්ග හේතුවෙන් ලබා දුන් අතුරු තහනම් නියෝග මත අත්හිටුවා ඇති බඳවාගැනීම්, එම අධිකරණ කටයුතු අවසන් වීමෙන් පසු අධිකරණ නියෝග මත නොපමාව සිදු කල යුතු නමුත් බඳවාගැනීම් ක්‍රියාවලිය සම්බන්ධයෙන් මෙම සීමා කිරීම් අනුව එම කටයුතු ද සිදු කළ නොහැකිව ඇත. එමෙන්ම විශේෂ තාක්ෂණික නිපුණතා අවශ්‍ය තනතුරුවලට සහ දෙපාර්තමේන්තුගත සේවාවලට සිදු කරන බඳවාගැනීම්වලට මෙම සීමා කිරීම නිසා ඇති වන රික්තය ඉදිරියේදී එම සේවාවන්වල උසස්වීම් ලබා දීමේදී ද බලපානු ඇත. රාජ්‍ය සේවය ප්‍රශස්ත මට්ටමින් පවත්වාගෙන යාමට බලපාන මෙවැනි කරුණු රාශියක් සලකා බලමින් අදාළ පරිදි අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා ආයතන සඳහා සිදු කළ යුතු අත්‍යවශ්‍ය බඳවාගැනීම් සහ පුරප්පාඩු සම්පූර්ණ කිරීම විධිමත් පරිදි සමාලෝචනය කර තනතුරුවල අවශ්‍යතා, ප්‍රමුඛතා හා කාල රාමුවක් හඳුනා ගනිමින් අමාත්‍ය මණ්ඩලය වෙත නිර්දේශ ඉදිරිපත් කිරීමට රාජ්‍ය සේවයේ බඳවාගැනීමේ ක්‍රියාවලිය සමාලෝචනය කිරීම සඳහා නිලධාරී කමිටුව අමාත්‍ය මණ්ඩලය විසින් පත් කර ඇත.

ඒ අනුව, නව බඳවාගැනීම් සම්බන්ධව හෝ තනතුරුවල පුරප්පාඩු සම්පූර්ණ කිරීම සඳහා වන ඉල්ලීම් ඉදිරිපත් කිරීමේ දී එම ඉල්ලීම් සාධාරණීකරණය කරමින් විෂය භාර අමාත්‍යාංශ ලේකම්වරයා විසින් මෙම කමිටුව වෙත යොමු කළ යුතු වුවද, ඇතැම් ආයතන ප්‍රධානීන් විසින් අමාත්‍යාංශ ලේකම්වරයාගේ නිරීක්ෂණ හා නිර්දේශ නොමැතිව සෘජුවම ඉල්ලීම් කමිටුව වෙත ඉදිරිපත් කරන බව නිරීක්ෂණය කරමි.

එබැවින්, ඔබ අමාත්‍යාංශය යටතේ ඇති සියලුම දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙත මින් ඉදිරියට එවැනි ඉල්ලීම් ඉදිරිපත් කිරීමේදී සාධාරණීකරණයන් හා නිර්දේශ සහිතව ඔබ මගින් පමණක් කමිටුව වෙත අදාළ ඉල්ලීම් යොමු කරන ලෙස උපදෙස් ලබා දෙන මෙන් කාරුණිකව දන්වමි.

අනුර දිසානායක
අග්‍රාමාත්‍ය ලේකම් හා
සභාපති, රාජ්‍ය සේවයේ බඳවාගැනීම් ක්‍රියාවලිය සමාලෝචනය කිරීමේ අමාත්‍ය මණ්ඩල නිලධාරී කමිටුව


දුරකථන අංකය : +94 11- 2575311    ෆැක්ස් අංකය : +94 11- 2575310
විද්‍යුත් ලිපිනය : secpm@pmoffice.gov.lk


පිටපත් :-01. ජනාධිපති ලේකම්
02. විගණකාධිපති
03. අමාත්‍ය මණ්ඩලයේ ලේකම්
04. ලේකම්, මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය
05. ලේකම්, රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය
06. අධ්‍යක්ෂ ජනරාල්, ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුව
07. අධ්‍යක්ෂ ජනරාල්, රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිව්‍යුහගතකරණ ඒකකය
08. ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්
09. අධ්‍යක්ෂ ජනරාල්, කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව


| | | | | | |
|---|---|---|---|---|---|
| කාර්යාලය<br>அலுவலகம்<br>Gen. Office | 2575317<br>2575318 | ෆැක්ස්<br>பெக்ஸ்<br>Fax | 2574143<br>2575454<br>2575310 | විද්‍යුත් තැපැල<br>ஈ மெயில்<br>E - mail | secpm@pmoffice.gov.lk |